# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 16 දරන පඩි හා මිම්මි (සංශෝධන) පනත

---

[සංගනිකය සටහන් කළේ 1979 මාර්තු මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව ශත : 25 යි.

# 1979 අංක 16 දරන පඩි හා මිමි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 14 වන දින]

එල්.ඩී.—ඕ. 35/78

පඩි හා මිමි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 16 දරන පඩි හා මිමි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1971 අංක 7 දරන පනතින් සංශෝධිත පඩි හා මිමි ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 158 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ආ) යම් නිශ්චිත දිස්ත්‍රික්කයක් හෝ ප්‍රදේශයක් සඳහා පඩි හා මිමි අධිකාරිවරයකු වශයෙන් හෝ සහකාර අධිකාරිවරයකු වශයෙන් හෝ ඒ ධුරයන්හි වැඩ බැලීමට නමින් හෝ ධුරයෙන් තැනැත්තකු.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 35ආ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 35ආ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

" ඇතැම් ස්ථාන වලට ඇතුළු වී, බඩු කිරුම් හෝ මිනුම් පරීක්ෂා කිරීම සඳහා මිල පාලන පරීක්ෂක වරයන්ට ඇති බලය.

35ආ. යම් මිල පාලන පරීක්ෂකවරයකුට—

(අ) (යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයක් ඇතුළුව) ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක හෝ ප්‍රදේශයක යම් වෙළෙඳමක් පිළිබඳ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයකට ඇතුළුවීමට සහ ගැනුම්කරුවකුට බඩු භාරදීමේ කාර්යය සඳහා කරනු ලබන හෝ කරනු ලැබූ යම් කිරුමක් හෝ මිනුමක් පිළිබඳව පරීක්ෂා කර බැලීමට ;

(ආ) 44ආ වන වගන්තිය කඩ කරමින් භාර දෙන ලද යම් බඩු, 44ආ වන වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක කාර්යය සඳහා තහනමකට ගෙන, රඳවා තබා ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක එසේ ඒ බඩු තහනමට ගෙන රඳවා තබා ගැනීමට

බලය තිබිය යුතුය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" නඩු පැවරීම සඳහා අනුමතය.

49. මේ ආඥාපනත යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව කිසිම නඩු පැවරීමක්, ඒ වරද සිදු කරන ලදැයි කියනු ලබන්නේ යම් දිස්ත්‍රික්කයක ද නැතහොත් ප්‍රදේශයක ද ඒ දිස්ත්‍රික් කයේ හෝ ප්‍රදේශයේ අධිකාරිවරයාගේ හෝ සම්මත

ප්‍රමාණ භාරකරුගේ ලිඛිත අනුමතයෙන් හැර හෝ ලිඛිත අනුමතය ඇතිව මිස හෝ කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත් වූ ප්‍රදේශය තුළ සිදු කරන ලදැයි කියනු ලබන යම් වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක්, ඒ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයාගේ ලිඛිත අනුමතය ඇතිව, කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) " අධිකාරිවරයා " යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' " අධිකාරිවරයා " යන්නෙන් 2 වන වගන්තිය යටතේ පත් කරන ලද පඩි හා මිම් අධිකාරිවරයෙක් හෝ සහකාර අධිකාරිවරයෙක් අදහස් වේ;' තවද

(ආ) " නියමිත " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " මිල පාලන පරීක්ෂකවරයා " යන්නෙන් (173 වන අධිකාරය වූ) මිල පාලන පනත යටතේ පත් කරන ලද මිල පාලන පරීක්ෂකවරයෙක් අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උප ලේඛනයෙහි I වන, II වන, III වන, IV වන, XII වන සහ XIII වන කොටස් සංශෝධනය කිරීම.

**6.** 1974 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි I වන කොටසේ, 1 වන කරුණෙහි "ගුණක සාධක" "උපසර්ගය" සහ "එස්අයි සංකේතය" යනුවෙන් ශීර්ෂ ගත කර ඇති එක් එක් තීරවල ශීර්ෂයට පිළිවෙලින් පහත දක්වෙන දේ එකතු කිරීමෙන්:—

"1 000 000 000 000 000 000 — $10^{18}$ එක්සා E

1 000 000 000 000 000 — $10^{15}$ පෙටා P".

(2) එහි II වන කොටසේ "2—දිග මැනීම" යන ශීර්ෂය යටතේ වූ "2.1 වෙනත් මෙට්‍රික් ඒකක" යන කරුණෙහි

"සෙන්ටිමීටරය=මීටර 1/100" යන සියලු ම වචන සහ ඉලක්කම් වෙනුවට,

"සෙන්ටිමීටරය, සංකේතය— cm=මීටරයකින් 1/100ක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එහි III වන කොටසේ "3—වර්ග ඵලය මැනීම" යන ශීර්ෂය යටතේ—

(අ) "3.1 එස් අයි ඒකක" යන කරුණෙහි—

(i) "වර්ග මීටරය =පැත්තක් දිගින් මීටරයක් වන සම චතුරශ්‍රයක පෘෂ්ඨීය වර්ග ඵලය" යන වචන වෙනුවට,

"වර්ග මීටරය, සංකේතය—$m^2$ =පැත්තක් දිගින් මීටරයක් වන සම චතුරශ්‍රයක පෘෂ්ඨීය වර්ග ඵලය"

යන වචන ආදේශ කිරීමෙන්;

(ii) "වර්ග කිලෝමීටරය = වර්ග මීටර 1 000 000"
යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"වර්ග කිලෝමීටරය, සංකේතය—$km^2$ =වර්ග මීටර 1 000 000"

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(iii) "වර්ග මිලිමීටරය=වර්ග මීටර 1/1 000 000"
යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"වර්ග මිලිමීටරය, සංකේතය—$mm^2$ = වර්ග මීටර 1/1 000 000"

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) "3.2 වෙනත් මෙට්‍රික් ඒකක" යන කරුණෙහි—

(i) "හෙක්ටාරය=ආර 100=වර්ග මීටර 10 000"
යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"හෙක්ටාරය, සංකේතය—ha=ආර 100 =වර්ග මීටර 10 000"

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) "ආරය=වර්ග මීටර 100"
යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"ආරය, සංකේතය— *a*=වර්ග මීටර 100"
යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iii) "වර්ග ඩෙසිමීටරය=වර්ග මීටර 100"
යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"වර්ග ඩෙසිමීටරය, සංකේතය— $dm^2$=වර්ග මීටර 1/100"; සහ

(iv) "වර්ග සෙන්ටිමීටරය=වර්ග මීටර 1/10 000"
යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"වර්ග සෙන්ටිමීටරය, සංකේතය—$cm^2$=වර්ග මීටර 1/10 000"

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එහි IV වන කොටසේ "4—පරිමා හෝ ධාරිතා මැනීම" යන ශීර්ෂය යටතේ—

(අ) "4.1 එස්අයි ඒකක;" යන කරුණෙහි—

"ඝන මීටරය=පැත්තක් දිගින් මීටරයක් වන ඝනයක පරිමාව"

යන වචන සහ ඉලක්කම් වෙනුවට,

"ඝන මීටරය, සංකේතය—$m^3$=එක් එක් දාරය දිගින් මීටරයක් වන ඝනයක පරිමාව"

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) " 4.2 වෙන්ත් මෙට්‍රික් ඒකක ;" යන කරුණෙහි—

(i) " හෙක්ටොලීටරය=ලීටර 100 (ඝන ඩෙසිමීටර 100) =ඝන මීටර 1/10 "
යන වචන සහ ඉලක්කම් වෙනුවට,
" හෙක්ටොලීටරය, සංකේතය—hl=ලීටර 100 (ඝන ඩෙසිමීටර 100) =ඝන මීටර 1/10"
යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) " ඝන ඩෙසිමීටරය = ඝන මීටර 1/1 000 "
යන වචන සහ ඉලක්කම් වෙනුවට,
" ඝන ඩෙසිමීටරය, සංකේතය—$dm^3$ = ඝන මීටර 1/1 000 "
යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(iii) " ලීටරය = ඝන ඩෙසිමීටරය = ඝන මීටර 1/1 000 "
යන වචන සහ ඉලක්කම් වෙනුවට,
" ලීටරය, සංකේතය—l=ඝන ඩෙසිමීටර 1 = ඝන මීටර 1/1 000 "
යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(iv) " ඝන සෙන්ටිමීටරය = ඝන මීටර 1/100 000 "
යන වචන සහ ඉලක්කම් වෙනුවට,
" ඝන සෙන්ටිමීටරය, සංකේතය—cc = ඝන මීටර 1/1 000 000"
යන වචන සහ ඉලක්කම් ආදේශකිරීමෙන් ; සහ

(v) " සෙන්ටිලීටරය=ලීටර 1/100=ඝන මීටර 1/100 000 "
යන වචන සහ ඉලක්කම් වෙනුවට,
"සෙන්ටිලීටරය, සංකේතය—cl=ලීටර 1/100 =ඝන මීටර 1/100 000 "
යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(5) එහි XII වන කොටසේ 12.1 කරුණ වෙනුවට පහත දැක්වෙන අලුත් කරුණ ආදේශ කිරීමෙන් :—

" 12.1 සක්‍රියතාව : න්‍යෂ්ටික සක්‍රියතාවය මැනීමේ එස් අයි ඒකකය බෙකරලය (සංකේතය — Bq) වේ. බෙකරලය වූ කලී තත්පරයකට න්‍යෂ්ටික පරිනාමන හෝ සංක්‍රමණ එකක් සිදුවන විකිරණශීලි ප්‍රභවයක සක්‍රියතාව වේ. ($Bq=s^{-1}$)".

(6) එහි XIII වන කොටසේ, 13.2 කරුණ වෙනුවට, පහත දැක්වෙන අලුත් කරුණ ආදේශ කිරීමෙන්—

" අයනීකරණ විකිරණයක අවශෝෂණ මාත්‍රය හෝ සමක මාත්‍රය. එස් අයි ඒකකය : අයනීකරණ විකිරණයක අවශෝෂණ මාත්‍රය හෝ සමක මාත්‍රය මැනීමේ එස් අයි ඒකකය ග්‍රේ (සංකේතය — Gy) වේ. යම් නියත ශක්ති ගලනයක් ඇති අයනීකරණ විකිරණයකට භාජන වන කිලෝග්‍රෑමයක් බරැති පදර්ථ මූලාංශුවකට ජූල ඒකක ශක්ති ප්‍රමාණයක් ඇතුලු වේ නම් එම මූලාංශුව මගින් අවශෝෂණය වන මාත්‍රාව ග්‍රේ එකක් වේ. (1 Gy=J/kg).".